# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2197/25 - 2020 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 40/1973 (I)

**(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා දේවි වන්නිආරච්චි,**
සෞඛ්‍ය අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 15 වන දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත, 1925 අගෝස්තු මස 28 වැනි දින, අංක 7481 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නියෝග හා ඇන්කිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගයේ "ප්‍රැටීක් අවසරය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන "පොදු ස්ථානය" යන යෙදුමේ අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"පොදු ස්ථානය" යන්නෙන් අයිතිවාසිකමක් වශයෙන් හෝ අන්‍යාකාරයෙන්, ගෙවීමක් සිදු කිරීමෙන් හෝ ගෙවීමක් කිරීමෙන් තොරව හෝ ආරාධනයක් ඇතිව හෝ නොමැතිව ජනතාවට ප්‍රවේශය ඇති යම් ස්ථානයක් අදහස් වේ." ;


1A - PG 005105 — 871 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 89 වන නියෝගයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් නියෝග එකතු කිරීමෙන් :-

"90. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක් තුළ, පොදු ස්ථානයක සිටින සෑම තැනැත්තකු ම හෝ වෙනත් තැනැත්තකු සමඟ සමීපස්ථ වීමට හැකියාව ඇති වෙනත් යම් ස්ථානයක සිටින සෑම තැනැත්තකු ම හෝ විසින් -

(අ) සෑම අවස්ථාවක දී ම මුව වැස්මක් පැළඳ සිටිය යුතු ය ; සහ

(ආ) තැනැත්තන් දෙදෙනකු අතර මීටර එකකට නොඅඩු සමාජ දුරස්ථභාවයක් පවත්වාගෙන යා යුතු ය.

91. නිසි බලධරයා විසින්, 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක් තුළ සිටින -

(අ) තැනැත්තන්ගේ සංචරණය සීමා කිරීම ;

(ආ) රෝගී තැනැත්තකු හෝ රෝගී තැනැත්තකු බවට සැක කරනු ලබන යම් තැනැත්තකු ප්‍රතිකාර සඳහා හෝ නිරෝධායන කාර්ය සඳහා රෝහලකට, නිරීක්ෂණ ස්ථානයකට හෝ නිරෝධායන මධ්‍යස්ථානයකට ගෙනයෑම හෝ එසේ ගෙන යන ලෙස යම් තැනැත්තකු වෙත නියම කිරීම ; හෝ

(ඇ) සමස්ත ශ්‍රී ලංකාව සඳහා නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට බීජෞෂණ කාලසීමාව නොඉක්මවන කාලයක් සඳහා රෝගය වැළඳී ඇති බවට සැක කරනු ලබන යම් තැනැත්තකු වෙත ස්වකීය නිවස තුළ, පරිශ්‍රය තුළ හෝ පදිංචි ස්ථානය තුළ ස්වයං නිරෝධායනය වන ලෙස විධාන කිරීම,

නීත්‍යානුකූල වන්නේය.

92. (1) 91 වන නියෝගය යටතේ තැනැත්තන්ගේ සංචරණය සීමාකිරීමෙන් පසුව සෑම තැනැත්තකු ම විසින් 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) පැතිරීම වැළැක්වීම පිණිස, නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ස්වකීය නිවස තුළ, පරිශ්‍රය තුළ හෝ පදිංචි ස්ථානය තුළ රැඳී සිටිය යුතු ය.

(2) (1) වන උපනියෝගයේ සඳහන් කාලසීමාව තුළ දී, යම් තැනැත්තකු විසින් 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන -

(අ) රෝගී ප්‍රදේශයකට ඇතුල්වීම හෝ ඉන් පිටවීම ;

(ආ) රෝගී ප්‍රදේශයක් තුළ ඇති යම් පොදු ස්ථානයකට ගමන් කිරීම, ප්‍රවාහන කටයුතු කිරීම හෝ ඇතුල්වීම ; හෝ

(ඇ) රෝගී ප්‍රදේශයක් තුළ ගමන්කිරීම,

සිදු නොකළ යුතුය.

(3) නිසි බලධරයා විසින් අවසර ලබා දී ඇත්නම් මිස, (1) වන උපනියෝගය යටතේ නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත යම් තැනැත්තකු විසින් රෝගී ප්‍රදේශයක් තුළ ජනතාව වෙත කිසිදු ආයතනයක්, ව්‍යාපාරික ස්ථානයක් හෝ වෙනත් ඊට සමාන පරිශ්‍රයක් විවෘත කරනු නොලැබිය යුතු ය.

93. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක ජාතික ආරක්ෂාව හෝ මහජන සෞඛ්‍ය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන්නා වූ අත්‍යවශ්‍ය සේවා හෝ වෙනත් යම් සේවාවක් සපයනු ලබන යම් ආයතනයක්, සේවා ස්ථානයක්, සුපිරි වෙළෙඳ සැලක්, වෙළෙඳ සැලක්, බිහිවෙළෙඳ පොළක් හෝ වෙනත් යම් ව්‍යාපාරික ස්ථානයක් මෙහෙයවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

94. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය පවත්වාගෙන යෑම හෝ 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන අත්‍යවශ්‍ය සේවා හෝ වෙනත් යම් සේවාවක් සපයනු ලබන යම් ආයතනයක හෝ සේවා ස්ථානයක සේවායෝජක විසින් හෝ ඒ ආයතනය හෝ සේවා ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් එම සේවාවන් පවත්වාගෙන යාමේ දී -

(අ) නිසි බලධරයා විසින් නියම කරනු ලබන යම් වේලාවක් ඇතුළත යම් පරිශ්‍රයක් තුළ සිටිය හැකි බවට අවසර දී ඇති උපරිම සේවා නියුක්තයන් සංඛ්‍යාව සහ වෙනත් තැනැත්තන් සංඛ්‍යාව ඉක්මවන සංඛ්‍යාවක් තබා නොගත යුතු ය ;

(ආ) එම ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකු ම සෑම අවස්ථාවක දී ම මුව වැස්මක් පැළඳ සිටින බවට සහතික විය යුතු ය ;

(ඇ) තැනැත්තන් දෙදෙනකු අතර මීටර එකකට නොඅඩු සමාජ දුරස්ථභාවයක් පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු ය ;

(ඈ) ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වීමට පෙරාතුව සෑම තැනැත්තකුගේ ම ශරීර උෂ්ණත්වය මැන බලනු ලබන බවට සහතික විය යුතු ය ;

(ඉ) ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකු ම සඳහා සබන් සහ විෂබීජනාශක දියර සමගින් ප්‍රමාණවත් පරිදි අත් සේදීමේ පහසුකම සලස්වනු ලැබිය යුතු අතර ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකු ම එසේ එම ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වීමට පෙරාතුව ඔවුන්ගේ අත් සෝදනු ලබන බවට සහතික විය යුතු ය ;

(ඊ) ආයතනයට හෝ සේවා ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකුගේ ම නම, හැඳුනුම්පත් අංකය සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය ; සහ

(උ) නිසි බලධරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් රෝග වැළැක්වීමේ පියවරවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

95. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක අත්‍යවශ්‍ය සේවාවක් හෝ වෙනත් යම් සේවාවක් සපයනු ලබන යම් සුපිරි වෙළෙඳ සැලක, වෙළෙඳ සැලක, බිහිවෙළෙඳ පොළක හෝ වෙනත් යම් ව්‍යාපාරික ස්ථානයක අයිතිකරු හෝ එහි කාර්යභාර යම් තැනැත්තකු හෝ විසින් -

(අ) නිසි බලධරයා විසින් වරකට එකී පරිශ්‍රය තුළ සිටිය හැකි බවට අවසර දී ඇති උපරිම තැනැත්තන් සංඛ්‍යාව නොඉක්මවිය යුතු ය ;

(ආ) එවැනි පරිශ්‍රයක් වෙත ඇතුල්වන සෑම තැනැත්තකු ම සෑම අවස්ථාවක දී ම මුව වැස්මක් පැළඳ සිටින බවට සහතික විය යුතු ය ;

(ඇ) තැනැත්තන් දෙදෙනකු අතර මීටර එකකට නොඅඩු සමාජ දුරස්ථභාවයක් පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු ය ;

(ඈ) පරිශ්‍රයට ඇතුල්වීමට පෙරාතුව සෑම තැනැත්තකුගේ ම ශරීර උෂ්ණත්වය මැන බලනු ලබන බවට සහතික විය යුතු ය ;

(ඉ) එවැනි පරිශ්‍රයකට ඇතුල්වන තැනැත්තන් සඳහා සබන් සහ විෂබීජනාශක දියර සමගින් ප්‍රමාණවත් පරිදි අත්සේදීමේ පහසුකම සලස්වනු ලැබිය යුතු අතර එවැනි පරිශ්‍රයකට ඇතුල්වන සෑම තැනැත්තකු ම එසේ පරිශ්‍රයට ඇතුල්වීමට පෙරාතුව ඔවුන්ගේ දෑත් සෝදන බවට සහතික විය යුතු ය ; සහ

(ඊ) නිසි බලධරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් රෝග වැළැක්වීමේ පියවරවලට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

96. යම් තැනැත්තකුගේ ශරීර උෂ්ණත්වය නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලබන ශරීර උෂ්ණත්වයට වඩා වැඩි වන අවස්ථාවක දී, එම තැනැත්තාට 94 වන සහ 95 වන නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි සේවා ස්ථානය වෙත හෝ පරිශ්‍රය වෙත ඇතුල්වීම සඳහා අවසර ලබා නොදිය යුතු ය.

97. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් -19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක පොදු ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන යම් මෝටර් වාහනයක රියැදුරු, කොන්දොස්තර සහ හිමිකරු විසින් මගීන් දෙදෙනකු අතර නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලබන සමාජ දුරස්ථභාවයක් පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර නිසි බලධරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් රෝග වැළැක්වීමේ පියවර සමග අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

98. නිසි බලධරයා විසින් 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක සංචරණ සීමාවන් ඉවත් කර ඇති අවස්ථාවක දී, පොදු ස්ථානයකට හෝ වෙනත් යම් තැනැත්තකු සමග සමීපස්ථ වීමට හැකියාව ඇති වෙනත් යම් ස්ථානයකට ඇතුල්වන සෑම තැනැත්තකු ම හෝ රැස්වීමක්, සම්මන්ත්‍රණයක් හෝ එවැනි සමාන මහජන එකතුවීමක් සැලසුම් කරනු ලබන හෝ සංවිධානය කරනු ලබන සෑම තැනැත්තකු ම හෝ අත්‍යවශ්‍ය සේවා ඇතුළු සියලු සේවා ලබා ගන්නා සෑම තැනැත්තකු ම නිසි බලධරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් රෝග වැළැක්වීමේ පියවරවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.”.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.